**කවරයේ කතාව**

# 2000 දී බිහිවන ඊ-ජීවිතය

2000 න් පසු අප පිවිසෙන ලෝකය දැන් අපට දැකබලාගත හැකි වත්තට අත ළඟට ම ඇවිත්. අපේ එදිනෙදා ජීවිතය අපට නොපෙනෙන වයර් ජාලයකින් සහ තරංග ජාලයකින් දැන් වෙලාගෙන තිබෙනවා. රූපවාහිනී නාලිකා දුරකතන ලොව නන් දෙසින් තොරතුරු ලබාගත හැකි විවිධ මාර්ග එක්තැන් කළා. අන්තර්ජාලයත් (ඉන්ටර්නෙට්) මේ පද්ධතියට ඇතුළත් වෙනවා. පසුගිය වසරේ ඩීප්බ්ලූ පරිගණකය ලෝක චෙස් ශූර ඇනටොලි කාපෝෆ් සමග තරග විදිනු දුටු ලොව පුරා ජනතාව පරිගණකයේ මහානුභාවසම්පන්න භාවය ගැන අංශුමාත්‍ර හෝ දැනුමක් ලබාගන්නට ඇති. පරිගණක විපයන් අනාගතයේ අපේ සෑම කාර්යයක් ම පාලනය කරන කාලය එතරම් ඈත නොවේ.

පසුගිය කාලයේ ඩයනා කුමරියගේ මරණය සමග ලොවපුරා ජනතාව සෝකය පලකලේ අන්තර්ජාලය සමඟ එක්වෙමිනුයි. ශෝක වූ ජනතාව තම හිතවතුන්ට තත්තල් තෑගි යැවීම සඳහා ඇනවුම් කලේ අන්තර්ජාලය මගිනුයි. දැන් හැම දෙයකට ම මෙම



වෙන්දේසි පොළක් – මෙගාගෙන්

අන්තර්ජාලය යොදගන්නවා. ඉලෙක්ට්‍රොනික තැපැල මගින් හෝ වෙබ් අඩවි මගින් තමන්ට ඕනෑ දෙයක් මිලදී ගන්නත් ඒවා අවශ්‍ය ඕනෑම තැනකාට යවාගන්නත් පුළුවන් වී තිබෙනවා.


දැන් ලෝකය ඩිජිටල් තාක්ෂණය වැළඳගෙන ඉවරයි. අපට කැමති වුණත් නොවුණත් ආපසු යෑම කළ නොහැකියි. මේ වන විට ලෝකය පුරා කෝටි 20 ක ජනතාවක් අන්තර්ජාලය හා එක්වෙලා ඉවරයි. එක්සත් ජනපදයේ පමණක් කෝටි 8 ක ජනකායක් මෙයට බැඳිලා. (ලංකාවේ දැනට 50,000 කට වැඩි සංඛ්‍යාවක් එක්වී ඉන්නවා.) මේ ඉලක්කම්වලින් කියැවෙන්නේ කතාවෙන් කොටසක් විතරයි. අන්තර්ජාලය තවදුරටත් අමුත්තක් නෙවෙයි. දැන් අපි එදිනෙදා ජීවිතයේදී වෛද්‍ය උපදෙස් ගන්නට, ගුවන් විදුලියට සවන් දෙන්නට, මුදල් ආයෝජනය කරන්නට, ණය ගන්නට, ප්‍රවෘත්ති ලබාගන්නට, දුරකතන කතාබහට, ඡන්ද කටයුතුවලට පමණක් නොවේ ලිංගික කටයුතුවලටත් ජාලය පාවිච්චි කරනවා.

අන්තර්ජාලය බිහිවීමට මඟ පෑදූ ආර්පනෙට් ජාලය ඇතිකරල දැන් හරියටම වසර 30 ක් වෙනවා. ආර්පනෙට් පටන් ගත්තේ ඇමරිකාවෙන්. විද්‍යාඥයන්ට සහ රජයේ ඉහළ මට්ටමේ පරිපාලකයන්ට අවශ්‍ය දැනුම හුවමාරු කරගන්නත් එක පරිගණකයක දැනුම ගබඩාකර තබා ගැනීමේදී හදිසියකදී විනාශයක් වුවහොත් ඇතිවන අලාභය මගහරින්නටත් දැනුම විසුරුවා හැරීම ආරක්ෂක පියවරක් ලෙසිනුත් මුල් යුගයේදී භාවිත කළා.

මීට අවුරුදු 25 කට උඩදී තමයි පුද්ගලික පරිගණක (PC) වල භාවිතය සඳහා මෘදුකාංලි ගයන්න පටන් ගත්තේ. (ඒ කාලේ බිල්ගේට් කියලා පාසල් ශිෂ්‍යයකුත් ඊට හවුල් වුණා) පහසුවෙන් පුද්ගලයකුට භාවිත කළ හැකි ලෙස බිහිවූ මේ මෘදුකාංග නිසයි අද අන්තර්ජාලය හැමෝට ම පාවිච්චි කරන්න පුළුවන් දෙයක් බවට පත්වෙලා තියෙන්නේ. එන්න එන්න ම මේ තත්ත්වය වඩ වඩාත් පහසු කරවීම නිසා අද අන්තර්ජාලයට එක්වීමට හැම කෙනෙකුට ම හැකියාව ලැබී තිබෙනවා. විශේෂ දැනුමක් අවශ්‍ය නෑ. අවුරුදු තුන හතරක් වගේ කාලයක් තුළ අන්තර්ජාලය ඉමහත් ජනප්‍රසාදයට පත්වෙමින් නිර්මාණශීලී කටයුතුවලට පවා දයක වී තිබෙනවා.


පාසල්වල, ව්‍යාපාරික ස්ථානවල, ශල්‍යාගාරවල, රසායනාගරවල, බැංකුවල ආදී මෙකී නොකී ලොව සෑම තැනක ම අන්තර්ජාලය හා මේ තාක්ෂණය සාමාන්‍ය දෙයක් බවට පත්වී තිබෙනවා. එමගින් අප මුලදී තොරතුරු සන්නිවේදනය සඳහා භාවිතකළ අන්තර්ජාලය දැන් අන්තර්ජාලය තුළින් පමණක් කළයුතු කටයුතු දක්වා විහිදී ගිහින් ඉවරයි.

අන්තර්ජාලය තුළින් පමණක් ව්‍යාපාරික කටයුතු කරන සමාගම් සහ නියෝජිත ආයතන තමයි මේ අන්තර්ජාලයට එක්වී තිබෙන අලුත් ම



ගුවන් ගමන් පෙරළිය – වෝකර්

ප්‍රවණතාව. සැන්ෆ්‍රැන්සිස්කෝ හෝ සිංගප්පූරුව හෝ බෙයිජිං හෝ ලොව ඕනෑම නගරයක සිට ව්‍යාපාරික කටයුත්තක් කිරීමට ව්‍යාපාර සම්බන්ධතා පැවැත්වීමට දැන් හැකිවී තිබෙනවා. අන්තර්ජාලය තුළ බිහිවන මේ නව සමාගම් මගින් ඔබට ඕනෑම දෙයක් ලොව පුරා ඕනෑම තැනකින් මිලදීගෙන අතට ම ගෙන්වා ගන්න පුළුවන්. මේ මගින් සිදුවී ඇති ඩිජිටල් (අංකිත) විප්ලවය නිසා නව මංමාවත් සහ යටිතල පහසුකම් සමග නව දර්ශන බිහිවී තිබෙනවා. ඒ ප්‍රවණතාව ගැනයි මේ ලිපියෙන් කියැවෙන්නේ. මේ නවලොකයේදී අපට මුහුණ පාන්නට ලැබෙන නව දිවිය නිව්ස්වීක් සඟරාව විසින් හඳුන්වන්නේ e-life හෙවත්



ඊ–කොම් –බෙසෝස්

ඉලෙක්ට්‍රොනික ජීවිතය කියා යි. දැන් ඒ අලුත් ලෝකය උදාවී ඉවරයි.

දැනට අන්තර්ජාලය හරහා නව අදහස් ලොවට දෙමින් 2000 න් එහා ලෝකයේ බලවතුන් බවට පත්වන ලකුණු පහළ කළ අය බොහෝ ය. ඉන් දැනටමත් මුල් තැනට පත්වී ඇත්තේ ඊ – කොම් (Amazon – Com) නම් ව්‍යාපාරය ආරම්භ කළ ජෙෆ් බෙසෝස් ය. ඔහුට ඒ අදහස පහළ වූයේ රට හරහා සවාරියක් යද්දී ය. අද ඔහුගේ වත්කම ඩොලර් බිලියන 7 කි. අන්තර්ජාලය හරහා පොත් අලෙවි කරන්නට පටන් ගත් ඔහු ලොව පුරා ඕනෑම පාඨකයකුට පරිගණකය හරහා ඕනෑම පොතක් හොඳින් තොරතුරු අධ්‍යයනය කර නිවසේ සිටම ඇනවුම් කොට ඉතා ඉක්මනින් නිවසට ම ගෙන්වා ගැනීමට හැකිවන විදියේ වැඩ පිළිවෙලක් ඇරඹී ය. " මං කිසිදෙයක් අලෙවි කරන්නේ නෑ. මං කරන්නේ ගැනුම්කරුවන්ට තමන්ට අවශ්‍ය දේ තෝරා ගැනීමට සහය වීමයි." ඔහු තම ව්‍යාපාරය ගැන කියයි.

ඔහු දැන් පොත්වලට අමතරව තවත් බොහෝ දේ තම ව්‍යාපාර ජාලයට එක් කරගෙන ඇත. පසුගිය දෙවසර තුළ ඇමසන් ගැනුම්කරුවන් ගේ ලැයිස්තුව මිලියන 2 සිට මිලියන 11 ක් දක්වා වැඩිවී ඇත. බෙසෝස් ගේ ව්‍යාපාරයට අද ගබඩා සංකීර්ණ 1000 ක් ලොව පුරා ඇත. "මේ වගේ අදහසක් කොයි විදියට මිනිස්සු පිළි ගනීවිද දන්නේ නෑ" කියමින් වකිතයකින් මේ කටයුත්තට අත ගැසූ ඔහු එය සැලසුම් කරන්නට වසරක් ගත කළේ ය. අද එය ලොව විශාලතම පොත් අලෙවි ව්‍යාපාරය යි. පොතක් නිවීහැනහිල්ලේ කියවා බලා අවශ්‍ය නම් මිලදී ගන්න මේ ක්‍රමයට හැකියාව ඇති නිසා එය ඉතාමත් ඉක්මනින් ජනප්‍රිය විය.

7 වැනි පිටුවට

# 2000 දී බිහිවන... 5 වැනි පිටුවෙන්



2000 දී බඩු භාණ්ඩ ගබඩාවක්

ලොව පුරා ජනතාව මෙතෙක් සාප්පු ගිය ආකාරය ජෙෆ් බෙසෝස් අතින් කෙතරම් ලොකු පෙරළියකට ලක්වුණා ද කිවොත් 2000න් එහා ලෝකයේ දී අපට අද දකින සාප්පු, ප්‍රදර්ශන ශාලා දක්නට නොලැබෙනු ඇත.

අද ඔහු ලොව පුරා ඇති කරන්නේ "බ්‍රික් ඇන්ඩ් මෝටාර්" නම් ගබඩාවන් ය. කෙනෙකු ගෙදර සිට ඇනවුම් කරන දෑ ගෙදරට ම ගෙන ගෙස් දෙන්නේ මේ වායේ සිට ය. මේ ක්‍රමයට වියදම් අඩුවන නිසා ගැනුම්කරුවන්ට ඉතාමත් අඩුමිලකට අවශ්‍ය දේ මිලදී ගැනීමටත් හැකි වන නිසා මෙය සීඝ්‍රයෙන් ජනප්‍රිය වෙමින් පවතී.

නායකයන් බිහිවන්නේ ලක්ෂ සංඛ්‍යාත ජනකායක් මෙහෙයවන්නට ය. ඒ වගේ ම ලෝකය වෙනස් කළ හැකි පරිගණක මෘදුකාංග ලියන්නට උපන් හැකියාවක් ඇති අයට අපේ ජීවිත හසුරුවන්නට හැකියාව ලැබෙයි. එවැනි වාසනාව ලත් එක් අයෙකි, ලිනික්ස් මෘදුකාංගයේ පියා ලෙස හැඳින්වෙන ටොවෝල්ඩ්ස්. Linux නම් පරිගණක වැඩසටහන පරිගණක පාවිච්චි කරන්නන්ට කෝකටත් තෛලයක් බඳු එකක් විය. ලොව පුරා ඕනෑම අයකුට අවසරයක් නොමැතිව එය අන්තර්ජාලය හරහා ලබා ගත හැකි ය. ඒ තුළින් පරිගණක 'මකුණන්' මරන්නට, නව අදහස් ක්‍රියාවට නංවන්නට, නව අදහස් එකතු කරන්නට තමන්ට අවශ්‍ය පරිදි එය වෙනස් කරගන්නට ලොව පුරා ඕනෑම කෙනෙකුට පුළුවන්. එය පුද්ගලික පරිගණක ඇති අය ගේ ජීවිතවලට නොයෙක් අයුරින් ප්‍රයෝජනවත් වෙයි. ඇය දැන් සුපිරි විපයක් සඳහා ක්‍රම ලේඛයක් ලියමින් සිටියි.

E – bay ආයතනය පිහිටුවා ලොව පුරා අන්තර්ජාලය හරහා වෙන්දේසි පොළද පොළක් ආරම්භ කළ මෙග් විට්මන් ඒ අතින් ලොව ඉහළ ම තැන ඉන්නා කාන්තාවයි. ඇගේ වත්කම දැනට ඩොලර් මිලියන 700 කි.

දැන් තවත් අය වෙන්දේසි කටයුතුවලට එක්වී ඇත. ඇමසන් ආයතනයේ පවා වෙන්දේසි පිටුවක් පටන්ගෙන ඇත. ප්‍රයිස්ලයින් නම් සමාගම අලුත් කාර් වෙන්දේසියක් අන්තර්ජාලය හරහා ආරම්භ කර ඇත. එහෙත් මෙග් විට්මන් ගේ වෙබ් අඩවියට එක්ව ඇති සංඛ්‍යාව දැනටමත් මිලියන 5.6 ඉක්මවා ඇත. වසරක් තුළ ඇය ඩොලර් 2.7 ක බඩු භාණ්ඩ වල අයිතිකරුවන් මාරු කර ඇත.

* * *

ඊ– කොම් හා ඊබේ ව්‍යාපාර අභිබවා මෙසේ ඉදිරියට ගිය තවත් අන්තර්ජාල ව්‍යාපාරයක් තිබේ. ඒ ජේ. වොකර් ගේ ප්‍රයිස්ලයින් ය. ඩොලර් බිලියන 3.2 ක වත්කමක් ඇති ඔහු ආරම්භ කර ඇත්තේ අමුතුම ව්‍යාපාරයකි. ඒ ගුවන් ගමන් ටිකට් පත් ,ගැනුම් කරුවන් කැමති මිලකට අලෙවි කිරීමයි. සාමාන්‍ය ක්‍රමයට ගුවන්යානාවල ආසන අලෙවි වූ පසු ලොව ඕනෑම ගුවන් යානයක හිස් අසුනක් ඇතොත් අවසන් මොහොතේ තමන් කැමති මිලක් ගෙවා එය ලබා ගැනීමට ගැනුම් කරුවන්ට ඉඩ සැලසේ. මේ නව ක්‍රමය ඉතාමත් ජනප්‍රිය වී ඇති අතර ඒ නිසා ගුවන් සමාගම්වලට නව ආදායම් මාර්ගපෑදී ඇත.

මෙවැනි නව ව්‍යාපාර රැසක් අපේ ජීවිතයට දැන් එක් වී තිබේ. 2000න් එහා ලෝකයේ දී අපට ඉලෙක්ට්‍රොනික ජීවිතයට මඟපාදන තවත් මෙවැනි ව්‍යාපාර රැසක් දැනට බිහිවෙමින් පවතී.

**අපේ ජීවිතයට බලපාන තවත් අය ගැන ලබන කලාපයේ**